රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2020.03.12

අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති)
ප්‍රවෘත්ති කර්තෘ,

# ප්‍රවෘත්ති නිවේදනය - COVID -19

- **අනවශ්‍ය කළබලවීමකින් තොරව රජයේ නිල නිවේදන කෙරෙහි අවධානය යොමු කරන්න**
- **තහවුරු කර තොරතුරු ලබාදීම සඳහා මාධ්‍ය මධ්‍යස්ථානය පිහිටුවයි**

මේ වන විට ශ්‍රී ලාංකික කොරෝනා රෝගීන් දෙදෙනකු හමුවී ඇති බව තහවුරු වී ඇති හෙයින් ඒ සම්බන්ධව රජය දැඩි අවධානයෙන් කටයුතු කරයි.

එසේම මෙම තත්ත්වය අවභාවිතා කර ගනිමින් විවිධ පාර්ශවයන් වෙබ් අඩවි සමාජ ජාලා සහ whatsapp, viber group හරහා මහජනයා කලබලයට පත්වන අයුරින් තහවුරු කර නොගත් තොරතුරු ප්‍රචාරය කරන බව රජයේ නිරීක්ෂණයට ලක්වී තිබේ.

ජාතික උපද්‍රවයක් පවතින මෙවැනි අවස්ථාවක වගකීම් රහිතව හැසිරීම රජය දැඩි ලෙස හෙළා දකිමින් එවැනි කාර්යයන්ගෙන් වැළකී සිටින ලෙස ඉල්ලා සිටින අතර එවැනි ක්‍රියාවන්හි නියැළෙන්නන් කෙරෙහි නීතිය දැඩිලෙස ක්‍රියාත්මක කරන බවත් රජය දන්වා සිටී.

එසේම පොදු මහජනතාවගෙන් රජය ඉල්ලා සිටිනු ලබන්නේ නිල හා තහවුරු කළ ප්‍රවෘත්ති පමණක් පිළිගෙන ඒ අනුව කටයුතු කරන ලෙසයි. මහජනතාව වෙත දැනුවත් කළ යුතු නිල තොරතුරු නොපමාව **සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය සේවා ප්‍රවර්ධන කාර්යාංශය හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව** විසින් නිල නිවේදන හරහා සියලුම මාධ්‍ය සහ මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

තවදුරටත් රජය සියලුම මාධ්‍ය ආයතනයන්ගෙන් ඉල්ලා සිටිනු ලබන්නේ ඉහත දක්වා ඇති ආයතන මඟින් තහවුරු කරන ලද නිල ප්‍රවෘත්ති පමණක් පළ කිරීමට හෝ ප්‍රචාරය කිරීමට කටයුතු කරන ලෙසයි.

එසේම යම්, යම් ස්ථානවල කොරෝනා ආසාදිත රෝගීන් සිටින බවට ගෙන යනු ලබන අසත්‍ය ප්‍රචාරවලට නොරැවටෙන ලෙසත්, එවැනි රෝගියෙකු යම් ස්ථානයකින්, යම් අවස්ථාවක තහවුරු වුවහොත් වහාම ඉහත රාජ්‍ය ආයතන විසින් නිල වශයෙන් ඒ පිළිබඳව මාධ්‍ය සහ මහජනතාව දැනුවත් කරනු ඇත.

එසේම අසත්‍ය ප්‍රචාරවලින් මහජනතාව නොමගයාම වැළැක්වීම සඳහා සහ මාධ්‍ය සඳහා තහවුරු කළ තොරතුරු ලබාදීමට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යංශය හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව එක්ව ***COVID - 19 මාධ්‍ය මධ්‍යස්ථානයක්*** ස්ථාපිත කර ඇති අතර කොරෝනා තත්ත්වය පිළිබඳ යම් තොරතුරක් මහජනතාවට දැනගැනීමට අවශ්‍ය නම් පහත අංකවලට පැය 24 පුරා ඇමතිය හැකිය.

1. 0710107107
2. 0113071073

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු. தொ. t (+94 11) 2515759
ෆැ. பெ. f (+94 11) 2514753
ඊ. மி. e infodept@slt.lk
www.news.lk

එසේම තහවුරු කළ නිල තොරතුරු පහත වෙබ් අඩවි, Face **book** පිටුවල නිරන්තරයෙන් පළ කරනු ලබන අතර එම තොරතුරු කෙරෙහි නිරන්තර අවධානය යොමු කරන ලෙස රජය ඉල්ලා සිටී.

1. Health promotion bureau (Face book page)
2. Department of Government Information (YouTube, Face book page)
3. News.lk (web site, Face book page )

එසේම මහජනතාව වෙත දැනුම්දිය යුතු සියලු කරුණු මාධ්‍ය වෙත දැනුම්දීම සඳහා මාධ්‍ය හමුවක් COVID - 19 මාධ්‍ය මධ්‍යස්ථානය විසින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ඒකාබද්ධව දෛනිකව පැවැත්වීමට කටයුතු යොදා ඇත.

රජය විසින් නිකුත් කරනු ලබන නිල නිවේදන සහ තොරතුරු පිළිබඳව අවධානය යොමු කරමින් තමන්ගේ දෛනික ජීවිතය අනවශ්‍ය ලෙස කලබලවීමකින් සහ අනියත බියවීමකින් තොරව සාමාන්‍ය පරිදි පවත්වාගෙන යන ලෙසත් රජය මහජනතාවගෙන් වැඩිදුරටත් ඉල්ලා සිටී.

නාලක කලුවැව
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්